පාසැල් සමයේ මතක සටහන්

බුරියානි කන්නට ගිය දා

මා ඉගෙනුම ලැබුවේ මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලයේය. එහි සිසුන් අතර බොදු, කතෝලික හා මුස්ලිම් යන කොටස් තුනම සිටියහ. අප පාසැලට නුදුරුව මීරමක්කන් යයි මුස්ලිම් පල්ලියක් ඇත. එවිට මට වයස අවුරුදු අටක් පමණ විය. එක් දිනක් එහි දුප්පත් මුස්ලිම් ළමයින් සඳහා දානයක් තිබුණේය. මුස්ලිම් කෑම ඊට ඉහත රසබලා තිබෙන නිසා මටද මුස්ලිම් කෑමක් කෑමේ ආශාව ඇතිවූයේය. මම ද එදා දානේ වෙලාවට ඔලුවේ ලේන්සුවක් ද බැඳගෙන (මුස්ලිම් අය කරන්නාක් මෙන්) අනෙක් ළමයින් සමග බිම වාඩිවී දානය බෙදන තුරු බලාසිටියෙමි.

එක්තරා ලෙබ්බේ කෙනෙක් (මුස්ලිම් පූජකයෙක්) දානය බෙදන්නට පටන් ගත්තේය. මා ළඟට පැමිණි ඔහු දානය නොබෙදා මා දිහා බලාගත්වන බලා සිට අවසානයේ මෙසේ පැවසීය.

" ආ..... මේ අර ප්‍රනාන්දු මුදලාලි මාත්තියගෙ පුතා නේද....? කන්න නෙති ළමයි නම් කමක් නෑ..... නැගිටිනවා..... යනවා ගෙදර ඉක්මණට....."

ඔහු මා එතනින් එළවාගත්තේ ය. මට ඇතිවූයේ වස ලැජ්ජාවකි. එසේම කෑම නොලැබී යෑම නිසා කණගාටුවකි. මම ඉක්මනින් ගෙදර ගියෙමි. එකල අපේ තාත්තා මහනුවර දිස්ත්‍රික්කයේ සිටි ප්‍රසිද්ධ දානපති ව්‍යාපාරිකයෙකි. මා එතනින් කෑම තාත්තාට වන මදිකමක් ලෙස ලෙබ්බේ සිතන්නට ඇත.

එදින රාත්‍රියේ අටට පමණ අප නිවසේ දොරට හයියෙන් තට්ටුකරන හඬක් ඇසිණ. දොර ඇර බලන විට මා දුටුවේ අර ලෙබ්බේ සහ ඔහුගේ අතවැසියන් දෙදෙනෙකි. ඔවුන් ළඟ ඔසවාගත් විශාල භාජන වීය. ඒ බේසම්වල දුන්තෙල් බත්, බුරියානි, කුකුල් මස්, වෙනත් බැදුම් වර්ග සහ වටලප්පන් ආදී කෑම අපේ ගෙදර කාටත් පමණටත් වඩා ඇතිවන අයුරින් ගෙනැවිත් තිබුණේය.

මගේ වාසනාවට එදා උදේ වුණු සිද්ධිය ලෙබ්බේ අම්මාට කීවේ නැත. අම්මා සිතුවේ ඔහු අපේ තාත්තාගේ හොඳ යාළුවෙක් නිසා එසේ කෑම ගෙනෙන්ට ඇත කියාය. මම මගේ සහෝදරයින්ට පමණක් උදේ වුණු එම සිදුවීම ගැන කියා අම්මාටත් තාත්තාටත් එය නොකියන ලෙස ඔවුන් පොරොන්දු කරවා ගතිමි. දෙමාපියන් දැනගත්තේ නම් මට දඬුවම් ලැබෙනු නිසැකය. නමුත් මගේ සොහොයුරෝද මට ස්තුතිවන්ත වෙමින් එම රසවත් කෑම භුක්තිවින්දාහ.

ධාවන ශූරයෙකු වූ හැටි

මේ සිද්ධිය වන විට මට අවුරුදු දහයක් පමණ ඇත. පෙබරවාරි 4 වන දින නිදහස් උත්සවය සැමරීමට බෝගම්බර පිට්ටනියේ ක්‍රීඩා උත්සවයක් වූයේය. එදින තරඟයකට සහභාගි වෙන්නට මම මිතුරන් සමග උදෙන්ම එහි ගියෙමි. එහිදී තරඟය අරඹන්නට පෙර අපට උපදෙස් දුන්නේ අපේ නිවසට නුදුරුව පදිංචිව සිටි සෞඛ්‍ය නිලධාරී මහතෙකි. එදින ධාවන තරඟය මෙහෙයවූයේ ඔහුය.

" ළමයිනේ මම On your mark.... Get set... Go.... කියා වෙඩිල්ලක් පත්තු කරනවා... ඒ සද්දෙත් එක්කම ඔයාලා දුවන්න ඉගිලෙන්න ඕන... පිට්ටනිය වටේ රවුමක් දුවලා ආපහු මෙතෙන්ට ඇවිත් නවතින්න ඕන.... හොඳද...? පළමුවැනි, දෙවැනි, තුන්වෙනි ළමයින්ට තෑගි ලැබෙනවා. හරිද? ආ ඔන්න කවුරුත් දැන් ලෑස්ති වෙන්න...."

අපි පේලියට සිටියෙමු. අර කී විදියට වෙඩිල්ල පත්තු විය. අනෙක් ළමයින් දුවනවාද මම දුටුවෙමි. එහෙත් කිසියම් ප්‍රමාද දෝෂයකින් මම තවමත් සිටි තැනමය.

" දුවනවා ළමයො.....! මොකද ඔතන කරන්නෙ....? "

කවුදෝ කැගසා කියනු මට ඇසින. මා දුවන්නට ඉගිලුනේ එවිටය. ඒ වන විට මට ඉස්සරහින් දිවූ අය පේනතෙක් මානෙකවත් නැත. එහෙත් මම දිව්වෙමි. එසේ දුවගොස් පිට්ටනියේ අනෙක් පැත්තෙන් ගෙදර දිව්වෙමි. අනික් අයට මුහුණ දීමට මට ඇතිවූයේ ලැජ්ජාවකි.

එදින රැයේද කිසිවෙකු අපේ දොරට තට්ටු කළේය. මගේ සොහොයුරා දොර ඇරියේය. ඒ අර සෞඛ්‍ය නිලධාරියාය.

" කෝ ඇන්සන් ? අද මිනිහා රේස් එකකට සහභාගි වුණා.... අයියෝ නෝ වෙයාර් වත් නෑ....." ඔහු කීවේය.

එදා සිට බොහෝ කාලයක් යනතුරු මට පටබැඳී තිබුණු නම මිස්ට නෝ වෙයාර් ය.

විහාගයට දේවාලයට බාරයක් වූ හැටි !

මේ කාලයේ මගේ වයස 16 කි. මම අපොස විහාගයට සූදානම්වෙමින් සිටියෙමි. අපි දේවාලයකට ගොස් බාරයක් වෙමු යයි මගේ මිතුරෙක් යෝජනා කළේය. ඒ අනුව පූජාවට්ටියක්ද සාදාගෙන ඒ මැද රුපියල් පහේ කොළයක්ද තබා යහළුවන් සමග නුවර දේවාලයේ පෝළිමේ සිටියෙමි.

මට ඉදිරියේ සිටි ශිෂ්‍යයින්ගේ වට්ටි සහ එහි මුදල්ද ගෙන කපුමහතා ඔවුන්ට හොඳින් ස්තෝත්‍ර කියා යාතිකා කළේය. මගේ වාරය පැමිණිවිට භක්තියෙන් යුතුව වට්ටිය ඔහු දෙසට දිගු කළෙමි. එහෙත් එය බාර නොගත් කපු මහතා මෙසේ කීවේය.

" මේ පොඩි මහත්තෙයා ප්‍රනාන්දු මුදලාලි මහත්තෙයගෙ දෙවෙනි පුතා නේද? "

" ඔව්" යයි මම කීවෙමි. " හෙට මගේ විහාගෙ..... කරුණාකරලා ටිකක් යාතිකා කරන්න පුළුවන්ද.....? "

" යාතිකා කරන්න...? මම දැක්කා ඔය මහත්තෙයා ඊයේ මාළිගාවෙ පිට්ටනියේ පුට්බෝල් ගහනවා... පෙරේදා වැවරවුමෙ බයිසිකල් පැද්දා.... යනවා ගෙදර විගහට.... ගිහින් හොඳට පාඩම්කරනවා.... දෙයියො විහාග ඩිරෙක්ටර් නෙවෙයි ඔය ළමයා පාස්කරන්න...." එසේ කියමින් ඔහු මට දේවාලයෙන් පිටවී යන ලෙස අණ කළේය. බලාපොරොත්තු සුන්වූ මම ගෙදර ගියෙමි. එහෙත් දිනපතාම හොඳින් පාඩම්කර සම්මාන සහිතව විහාගයෙන් සමත් වීමි.

අපේ තාත්තාගේ නොමසුරු සමාජ සේවය සහ සියළු ආගම් සමග භේදයකින් තොරව කටයුතු කළ නිසා දෙවරක්ම මගේ බලාපොරොත්තු ඉටු වූයේ නැත. එහෙත් ඒ තුළින් මට යහපතක් වූ බව පැහැදිලිය.

♦ ***මහාචාර්ය සම්පත් ඇන්සන් ප්‍රනාන්දු***
Essex UK

ගෝණුස්සා

දැක්කමත් බයයි නේද? මෙයාලා වැඩි පුරම එළියට එන්නෙ වැහි කාලෙට. මේ අය විලෝපිකයො. ඒ කියන්නෙ තව සතෙක්ව තමයි ආහාර විදියට ගන්නෙ. පසුපස අර කෙලින් වුණු නැට්ටක් වගේ තියෙන්නෙ විෂ නබරයක්. (නියපොත්තකට සමාන) මේකෙ උග්‍ර විෂක් අඩංගුයි (අපිට වැදුනට මැරෙන්නෙ නෑ. ඒත් මාර සනීපයි) ඉතින් මොකද දන්නවද මුන් ගැන අද කතාකරන්න හිතුවෙ, මේ සත්තු කොච්චර නපුරු රෞද්‍ර සත්තු ජාතියක් වුනත් මුන්ගෙ තියන සමහර ගතිගුණ විස්මිතයි. ඒක පෙන්නලා දෙන්නයි.

ගෝණුස්සගෙ ගෑණු සතා ප්‍රජනනේට (සෙක්ස් වලට) හරි කැමතිලු. ඉතින් ගෝණුසු කොල්ලා කරන්නෙ ගෑණු සතෙක් ගාවට ගිහින් දන්න කියක වැඩ සේරම දාලා නටනවා. (අපේ සමහර අයත් එහෙම නේ.) ඉතින් සමහර වෙලාවට ගෝණුස්සො දෙන්නෙක් ගෝණුසු තරුණියකට ට්‍රයි කරනවා. අවසානය මහා යුද්ධයකින් කෙළවර වෙන්නෙ. මේකෙන් බොහෝ විට පිරිමි සත්තු දෙන්නම මැරෙනවා. නැත්නම් ඉතිරිවෙන එකා අතපය කඩාගෙන වුනත් ගෝණුස්සිව කැන්දනගෙන යනවා. (මුන් අපෙන් කොපි කරාද ? අපි මුන්ගෙන් කොපිකරාද ? අනේ මන්දා!)

හරි ඉතිං ඒක නෙවෙයි වැඩේ. දැන් මේ ගෝණුස්සි අම්ම කෙනෙක් වෙනවා. පුංචිපවුල රත්තරන් කියලා වරකට පැටවුන් 20 ක් විතර දානවලු. මේ පැටවු ලොකු වෙනකල් තමන්ගෙ පිටේ තියන් පෝෂණය කරනවා. ඉතාම සංවේදී කාරණය මේ පැටව් ආහාරයට ගන්නෙ තමන්ගෙ මවගෙ උච්චර්මය හෙවත් ඇහේ මතුපිට හම. ඒ හමත් එක්ක ඇහේ මසුත් කැඩිලා එනවා. මේ නිසාම ඒ ගෝණුසු අම්මා ටික කල කින්ම මැරිලා යනවා. ඊට පස්සෙ අර පැටව් ටික එකතුවෙලා මවගෙ ශරීරයේ කෑමට ගන්න හැකි හැම කොටසක්ම කාලා දානවා.

දැන් ඉතින් අහන්න එපා, ටිකක් කන කොටම ඒ ගෝණුස්සි ඇයි පැටව් ටික බිමට දාලා මරන්නෙ නැත්තෙ මව් සෙනෙහස නිසාමද? කියලා. ඒක මම දන්නෙ නෑ. මොකද පරිනාමයේ පහළ මට්ටමක ඉන්න මේ වගේ සතුන්ට ඒ වගේ හැඟීමක් දැනෙනවද කියන එක ප්‍රශ්නයක්. නමුත් මේක තමයි සොබාදහම. උන් සොබාදහමට අනුකූලව ඒ නීතිවලට යටත්ව ජීවත් වෙනවා. මට හිතෙන්නෙ එහෙමයි.

(***මේ සටහන ලැබුණේ ඊමේල් මගිනි. ලියුවේ කවුදැයි නමක් නොවීය. කවුරු හෝ වේවා ඔහුට අපේ ස්තුතිය !***)

අඩසැරය

බුද්ධෝත්පාද කාලයක්ද මේ?

තමා මෛත්‍රී බුදුන් බව කියන වඳුරඹ ලාල් සිරිවර්ධන

හුහ දෙනෙක් ලංකාවෙ ස්වභාවය හඳුන්වන්නෙ විවිධත්වය ඇති රටක් හැටියට. එකම විදියට නොපවතින වෙනස්වන, වෙනස්කම් වලට ඔරොත්තු දෙන රටක් හැටියට. ඒ මම කියපු වචන හුහක් වෙලාවට පාවිච්චි කරනවා මම දකිනව අපේ සංචාරක ව්‍යාපාරයට. සංචාරකයින්ට පෙන්වන්නෙ අනික් රටවල් වගේ නෙවෙයි ලංකාව ලෝකෙ කොහේවත් නැති අමුතුම රටක් හැටියට. ඒ ස්වභාවය ලෝකෙ කොහේවත් නැත්නම්, ඉතින් ලංකාවටම යන්න වෙනවා ඒ ගතිය දැක ගන්න.

මේ වෙනස්වන ගතිය අපේ රටේ ජනතාවගෙ ස්වාභාවික ගතිය වෙලා දැන්. සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, කතාබහ, කෑම බීම, දේශපාලනය, නීතිය, හැසිරීම මේ ආදී දේ බලන් ඉන්දෙද්දි එහේ වෙනස් වෙනවා. මේ වෙනස් වීමට දැන් ආගම දහමත් එකතු වෙලා. ආගම කිව්වම අනෙක් ආගම් නෙවෙයි බුද්ධාගම. බුද්ධාගම කිව්වම බුද්ද ධර්මය නෙවෙයි. ඒ බුදු දහම අපේ රටේ දැන් පිළි අරගෙන තියන විදිය. දැන් අපේ රටට බෝවෙලා ඇති අලුත්ම උන්මාදය තමයි අනාගතයේ පහළවෙන්නට නියමිත බුදුවරු දැන්මම ලංකාවෙ පහළකර ගැනීම. ඒකෙත් හොඳම එක තමයි දැන් ගාල්ලට මෛත්‍රී බුදුන් පහළවී ගාලු දිස්ත්‍රික්කය පුරා තම ශ්‍රාවකයන්ද එක්ක ඇවිදිනවාය කියන කාරණය.

තමා මෛත්‍රී බුදුන් යයි කියාගන්නා මේ පුද්ගලයාගේ නම කේ. ලාල් සිරිවර්ධන. ගම වඳුරඹ.

දැන් අවුරුදු කීපයකට ඉස්සර සිරිවර්ධන ආගමික දේශන කරන්න පටන් ගත්තා. කොළඹ ආවම දෙහිවල වයි. එම්. බී. ඒ ශාලාවෙ දේශනයක් කරනවා. සිරිවර්ධනගෙ ඒ දේශන පොතක් හැටියට ගහන්න මුද්‍රණ ශිල්පියෙක් බාරගත්තා. ඒ පොත් පත්‍රිකා ආදිය මිනිස්සු අතරට යන කොට සිරිවර්ධනගෙ නම ප්‍රසිද්ධ වුණා. පවතින බුදු දහම හා බෞද්ධ වත් පිළිවෙත් ඒ විදියටම දේශනා කළොත් ඒකෙ ඇති අලුත් දෙයක් නැනේ. ඒ නිසා එයා කළේ පිළිගත් බුදු දහමෙ තියන ආචාර විධි වෙනස් කරලා කීම. ඒ වෙනස් කිරීම මත ඔහු බොහෝ දෙනාගෙ කතා බහට ලක්වුණා. පත්තරවල ඔහු ගැන ලිපි පළවුණා. ටෙලිවිෂන් සාකච්ඡාවලට කැඳෙව්වා. සමහරු ඔහුට ප්‍රසිද්ධියෙ වාදෙකට අභියෝග කළා. පබ්ලිසිටි හෝ ගාලා ලැබෙන කොට සිරිවර්ධන සම්පූර්ණ වෙනස් මිනිහෙක් වුණා.

මේකාලෙ වෙන කොට සිරිවර්ධනට ගෑණු පිරිමි ගෝලයො ටිකක් ඇතිවුණා. ඒ ගෝලයො ප්‍රචාරය කළා සිරිවර්ධන සෝවාන් වෙලා බව. ලංකාවෙ සමහරු පිළිගත්තා ඒක ඇත්තය කියලා. මෙහෙම දිගටම අවුරුදු දෙක තුනක් යනකොට සිරිවර්ධන වගේම තව සෝවාන් වෙලාය කියන පුද්ගලයො ලංකාවෙ හැම තැනකින්ම මතුවෙනව පෙනුණා. ඒ අයත් දැන් සිරිවර්ධන වගේ වෙනම දේශනාකරන්න පටන් ගත්තා. ඒකෙන් වුණේ තමන්ට එතෙක් තිබුණු තත්වය දැන් ටිකක් බාලවෙනව වගේ සිරිවර්ධනට තේරුණා.

මේ දේවල් මෙහෙම වෙන අතරේ සෝවාන් තත්වයටත් එහා ගිය අය ඉන්න බව එක එක පළාත්වලින් ආරංචි වෙනන් පටන් ගත්තා. සකෘදාගාමී අය, අනාගාමී අය, රහත් භාවයට ආවාය කියන අය. නමුත් සිරිවර්ධන තවම සෝවාන් තත්වෙ. ඒක මදිකමක් හැල්ලුවක් නෙවෙයිද? ආන්න එතෙන්දි තමයි, මම හොඳ වැඩක් කරන්නම් කියලා සිරිවර්ධන ප්‍රකාශ කළා තමන් අන් කිසිවෙකු නොව මතු බුදුවෙන්නට සිටි මෛත්‍රී බුදුන් බව. අන්න එහෙමයි වඳුරඹ කේ. ලාල් සිරිවර්ධන මෛත්‍රී බුදුන් වුණේ.

මේ කිසි දෙයක් තනියම කරන්න පුළුවන් දේවල් නෙවෙයි. පිරිස ඕන. සිරිවර්ධනට කැප වෙච්ච පිරිසක් දැන් ඉන්නවා. බිස්නස් කාරයො, දොස්තරවරු, තාක්ෂණය දන්න පිරිස්. මේ සේරම දෙනා සිරිවර්ධන වටා ඉඳගන සපෝට් එක දෙනවා. පැහැදිලාද, වෙන හේතුවකටද කියන්න දන්නෙ නෑ. ඔහු ගැන දැන් වෙබ් අඩවි කීපයක් ඇරිලා තියනවා. ඔහුගේ හඬ පට, ඩීවීඩී ආදිය බෙදා හරිනවා. ඒ විදියට බැලුවම සිරිවර්ධන සෑහෙන නෙවෙයි නොසෑහෙන්න වාසනාවන්තයෙක්.

අපි අහල තියෙන්නෙ බුදුකෙනෙක් වෙන්න සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම්පුරන්න ඕන, දස පාරමිතා පුරන්න ඕන, ඇස්, ඉස්, මස්, ලේ දන් දෙන්න ඕන කියලා නේ. දැන් බලන කොට ඒ කිසි දෙයක් අවශ්‍ය නැතුව ලංකාවෙ නිකම්ම බුදුවරු පහල වෙනව. ඒකයි මම මේ ලියවිල්ලෙ මුලටම ලිව්වෙ ලංකාව වෙන කොහේවත් නැති අමුතුම රටක් කියලා. ඒ අමුතු ගතිය තව කල්පයක් එහෙමම තියේවි.

♦ ***වෙලේගෙදර රාළ London***